අග්‍රාමාත්‍ය කාර්යාලය
பிரதம அமைச்சரின் அலுவலகம்
PRIME MINISTER'S OFFICE

58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.
58, ஸ்ரீமத் ஏர்னஸ்ட் த சில்வா மாவத்தை, கொழும்பு 07.
58, Sir Ernest de Silva Mawatha, Colombo 07.
Web : www.pmoffice.gov.lk

මගේ අංකය : PMO/ Dev/ RuralEcon
දිනය : 2020.10.22

සියලුම රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත,

<u>ග්‍රාමීය ආර්ථිකය නඟා සිටුවීමේ ජාතික වැඩසටහන</u>

අතිගරු ජනාධිපතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් බිහිකිරීම සඳහා රජය විසින් ක්‍රියාත්මක කරන ජාතික ආර්ථිකය ගොඩනැගීමේ වැඩපිළිවෙළට සමගාමීව ග්‍රාමීය ආර්ථිකය නඟාසිටුවීමේ අවශ්‍යතාව ප්‍රමුඛතම කාර්යයක් ලෙස රජය විසින් හඳුනාගෙන ඇත. මෙම කාර්යය සාක්ෂාත් කර ගැනීම සඳහා **ග්‍රාමීය ආර්ථිකය නඟාසිටුවීමේ ජාතික වැඩසටහන** හඳුන්වා දී ඇත. මේ පිළිබඳව 2020.10.16 දින අරලියගහ මන්දිරයේ දී පැවැති රැස්වීමේ දී, ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධන බලකායේ සභාපති, ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා විසින් ඔබ දැනුවත් කරන ලදි.

දැනට, කැබිනට් අමාත්‍යාංශ හා රාජ්‍ය අමාත්‍යාංශ විසින් ක්‍රියාත්මක කරන වැඩසටහන්වල ප්‍රතිඵල ප්‍රාදේශීය මට්ටමින් වඩාත් කාර්යක්ෂමව ජනතාවට ලබා කර දීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් සකස් කිරීමේ අරමුණෙන් පහත සඳහන් ආකාරයට රාජ්‍ය අමාත්‍යාංශ විසින් ප්‍රාදේශීය වශයෙන් සපයන සේවාවන් පදනම් කරගෙන එම අමාත්‍යාංශ, කමිටු හතරකට වර්ග කර ඇත. එම කමිටුවලට අදාළ අමාත්‍යාංශවල නාම ලේඛනය මේ සමඟ අමුණා ඇත.

1. සමාජීය යටිතල පහසුකම් සංවර්ධන කමිටුව
2. ජීවනෝපාය සංවර්ධන කමිටුව
3. දේශීය නිෂ්පාදන කර්මාන්ත වැඩිදියුණු කිරීමේ සංවර්ධන කමිටුව
4. ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන කමිටුව

ඒ අනුව, එම කමිටු දිස්ත්‍රික් මට්ටමින් පවත්වන රැස්වීම්වල දී, අදාළ විෂයපථය තුළ හඳුනා ගනු ලබන ගැටළු හා සංවර්ධන අවශ්‍යතාවයන් මත සකස් කරන උපායමාර්ග, වැඩසටහන් හා ව්‍යාපෘති ඇතුළත් කිරීමට සහ ඒවායේ ප්‍රගතිය මැනීමට හැකි ආකාරයට ජාලගත තොරතුරු පද්ධතියක් (Web based system) ඉදිරියේ දී හඳුන්වා දෙනු ලබන අතර, එමඟින් එම ව්‍යාපෘතිවල ප්‍රගතිය යාවත්කාලීන කිරීම සිදුකළ හැකි වනු ඇත.

දුරකථන / தொலைபேசி / Telephones : 2575317 - 18, 2370737 - 38
ෆැක්ස් / தொலைநகல் / Fax : 2575310, 2574713
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail : secpm@pmoffice.gov.lk, Info@pmoffice.gov.lk

මෙම ජාලගත තොරතුරු පද්ධතිය හඳුන්වා දෙන තෙක් තොරතුරු වාර්තා කිරීම සඳහා 2020.10.16 දින ඔබගේ සහභාගීත්වය ද සහිතව අරලියගහ මන්දිරයේ දී පැවති වැඩමුළුවේ දී ඔබ විසින් ලබාදුන් යෝජනාවලට අනුකූලව සංශෝධනය කරන ලද ආකෘති පත්‍රය මේ සමඟ අමුණා එවමි. ඒ අනුව, එම ආකෘති පත්‍රය නිසි පරිදි සම්පූර්ණ කර, අදාළ දිස්ත්‍රික් රැස්වීම පවත්වා සති දෙකක් ඇතුළත මා වෙත වාර්තා කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

අත්/ කලේ ;
**ගාමිණී එස්. සෙනරත්**
අග්‍රාමාත්‍ය ලේකම්

**ඇන්ටන් පෙරේරා**
අග්‍රාමාත්‍ය අතිරේක ලේකම්

පිටපත:

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් - මේ සමඟ අමුණා ඇති ආකෘතිය අනුව අමාත්‍යාංශ සමඟ සම්බන්ධ වී දිස්ත්‍රික්කයේ ප්‍රගතිය වාර්තා කිරීම සඳහා

සටහන:

- මෙම ආකෘති පත්‍රයේ මෘදු පිටපත අග්‍රාමාත්‍ය කාර්යාලයේ නිල වෙබ් අඩවිය (http://www.pmoffice.gov.lk) වෙතින් බාගත කළ හැකිය.
- එක් එක් කමිටු සම්බන්ධීකරණය සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් පත්කර ඇති නිලධාරීන් පහත සඳහන් දුරකථන අංකවලට ඇමතීමෙන් සම්බන්ධ කර ගත හැකිය.

1. සමාජීය යටිතල පහසුකම් සංවර්ධන කමිටුව
   සහකාර ලේකම්, රිද්මා ජයසුන්දර මිය (071 4452622)
2. ජීවනෝපාය සංවර්ධන කමිටුව
   නියෝජ්‍ය අධ්‍යක්ෂ, මනෝ ධර්මබන්ධු මිය (071 8273347)
3. දේශීය නිෂ්පාදන කර්මාන්ත වැඩිදියුණු කිරීමෙ සංවර්ධන කමිටුව
   නියෝජ්‍ය අධ්‍යක්ෂ, ඒ.ටී. ඒකනායක මිය (077 3833873)
4. ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන කමිටුව
   සහකාර අධ්‍යක්ෂ, ගිලේනා අබේසේකර මිය (077 4068004)

සමස්ත සම්බන්ධීකරණ - සහකාර ලේකම්, ෆාතිමා ෆර්සානා මිය (077 7005446)
අධීක්ෂණය - අග්‍රාමාත්‍ය අතිරේක ලේකම්, ඇන්ටන් පෙරේරා මහතා (077 6600083)

Format

**Ministrial Proposals/ Progress Review Sheet**

Committee Name :
State Ministry :
Programmes / Projects :
Year :
Key Results Area (Thrust Area ) :
Province :
District :
Divisional Secretariat :

| **Strategy/ Programme/ Project** | **KPI** | | **Activities** | **Time Plan** | | **Annual Targets** | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | **Output** | **Outcome** | | **Starting Date** | **End Date** | **Physical** | | **Financial (Rs.)** | |
| | | | | | | **Planned** | **Actual** | **Planned** | **Actual** |
| Strategy 01 : | SDG: | | | VPS: | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| Strategy 02 : | SDG: | | | VPS: | | | | | |
| Programme 2.1 : | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

* SDG - Sustainable Development Goal Number
* VPS - Relevant Chapter of Vistas of Prosperity and Splendour
* KPI - Key Performance Indicator

Last Updated : / / 2020
Signature :